රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

அரச கணக்குகள் திணைக்களம்

# Department of State Accounts

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | SA/IC/1/3 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2013.12. 9 |

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක : **232 /2013**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත

## 2014 වසර තුලදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මාසික ගිණුම් සාරාංශ මගින් ගිණුම් දත්ත සම්ප්‍රේෂණය කිරීම

අමුණා ඇති උපලේඛණයේ සඳහන් කර ඇති පරිදි සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් 2014 වසර තුලදී, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මාසික ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම සඳහා නියමිත දින පසුපිටෙහි දක්වා ඇත.

2. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් කිසියම් මාසයක් සඳහා වූ මාසික ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන ඒ හා පසුව යෙදෙන මාසයේ 12 වන දිනට පෙර සම්පිණ්ඩනය කිරීම කල යුතුවේ. එබැවින් එසේ නියම කරන ලද දිනයන්ට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි මාසික ගිණුම් සාරාංශය විද්‍යුත් තැපැල මගින් පමණක් එවීමට කටයුතු යොදන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. සාවද්‍ය තොරතුරු භාණ්ඩාගාර ගිණුම් වලට ඇතුලත් වීම වළක්වා ගනු සඳහා CIGAS වැඩසටහනට එදිනෙදා ඇතුලත් කරන තොරතුරු දිනපතා පරීක්ෂාකර නිවැරදි තොරතුරු එවීමට කටයුතු යොදන මෙන් කාරුණිකව දන්වමි. මෙලෙස ඉදිරිපත් කරනු ලබන ගිණුම් සාරාංශය ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී විසින් <u>පරීක්ෂා කිරීමෙන් පසුව පමණක්</u> විද්‍යුත් තැපැල මගින් එවීමට කටයුතු කල යුතු වේ.

3. එමෙන්ම යම් දත්ත ප්‍රතික්ෂේප කිරීමක් වෙතොත් ඒ සම්බන්ධයෙන් විද්‍යුත් තැපැල හරහා ඔබ වෙත දැනුම් දෙනු ලබන අතර, සිදු කරනු ලබන අවශ්‍ය නිවැරදි කිරීම් එසේ සඳහන් කරන ලද දිනට හෝ ඉන් පෙර ලබා ගැනීමට මෙම දෙපාර්තමේන්තුව අපේක්ෂා කරන බව මෙයින් දන්වා සිටිමි.

4. ප්‍රමාද වන මාසික ගිණුම් සාරාංශ පිළිබඳව ගත හැකි ක්‍රියාමාර්ගය විස්තර කර ඇති මු.රෙ. 426 කෙරෙහිද ඔබගේ කාරුණික අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

එන්.ජී. දයාරත්න

රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙනුවට

පිටපත : විගණකාධිපති


මහ භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව පொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka. General - Tel.: +94 112 484600 Website: www.sad.gov.lk
Director General - Tel.: +94 112 484728 Fax: +94 112 473856 e-mail: dgsa@sad.treasury.gov.lk Additional Director General - Tel.: +94 112 484898
Director (Accounting & Reporting): +94 112 484747 Director (Accounting Services): +94 112 484753 Director (Systems & Training): +94 112 484733

| ගිණුම්කරණ මාසය | විද්‍යුත් තැපැල මගින් භාණ්ඩාගාරයට දත්ත එවීමට ඉඩ දී ඇති අවසාන දිනය | | | |
|---|---|---|---|---|
| | උපලේඛණ - 1 | | උපලේඛණ - 11 | |
| ජනවාරි | පෙබරවාරි | 06 | පෙබරවාරි | 10 |
| පෙබරවාරි | මාර්තු | 05 | මාර්තු | 07 |
| මාර්තු | අප්‍රේල් | 03 | අප්‍රේල් | 07 |
| අප්‍රේල් | මැයි | 06 | මැයි | 08 |
| මැයි | ජූනි | 04 | ජූනි | 06 |
| ජූනි | ජූලි | 03 | ජූලි | 07 |
| ජූලි | අගෝස්තු | 05 | අගෝස්තු | 07 |
| අගෝස්තු | සැප්තැම්බර් | 03 | සැප්තැම්බර් | 05 |
| සැප්තැම්බර් | ඔක්තෝබර් | 03 | ඔක්තෝබර් | 07 |
| ඔක්තෝබර් | නොවැම්බර් | 05 | නොවැම්බර් | 07 |
| නොවැම්බර් | දෙසැම්බර් | 03 | දෙසැම්බර් | 05 |
| දෙසැම්බර් | මෙම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන 2014 මුදල් වර්ෂයේ ගිණුම් පියවීමේ චක්‍රලේඛයේ උපදෙස් පරිදි | | | |